Australian Government

Department of Health

**වයෝවෘද්ධ රැකවරණ ක්ෂේත්‍රයේ කෝවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක්වූ අය සඳහාවූ ශෝකය හෝ සිතෙහි ඇතිවූ කම්පනය සම්බන්ධ උපකාර**

ඕස්ට්‍රේලියානු වයෝවෘද්ධ රැකවරණ ක්ෂේත්‍රය තුල ශෝකය, සමීප අය නැතිවීම සහ සිතෙහි ඇතිවූ කම්පනය සම්බන්ධ උපකාර ලබාදීම සඳහා සේවා හට ඕස්ට්‍රේලියානු රජය අරමුදල් ලබාදේ. සේවා ලබාගත හැක්කේ නේවාසික වයෝවෘද්ධ නිවැසියන්, නිවෙස් රැකවරණ ලාභීන්, ඔවුන්ගේ සමීප අය සහ වයෝවෘද්ධ රැකවරණ කායර් මණ්ඩල සඳහාවේ. මෙම සේවා ඔබ විසින්ම ලබා ගත හැකි අතර ඔබගේ සමීප අය සහ ප්‍රජාවද මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

මෙම සේවා සෑම අයෙකුටම නොමිලේ ලබාගත හැකිවේ.

මෙම සියළුම සංවිධාන මිනිසුන්ගේ සංස්කෘතිය, ආගම, අනන්‍යතාවය සහ ජීවන රටාව සම්බන්ධයෙන් ගෞරවයෙන් කටයුතු කරනු ඇත. ඔබට හෝ ඔබගේ සමීප අය හට භාෂා පරිවතර්කයෙකු අවශ්‍යනම්, දුරකථන අංක 131 450 ඔස්සේ භාෂා පරිවතර්න සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service) අමතන්න. ඔබගේ භාෂාව සහ ඔබට සම්බන්ධවීමට අවශ්‍ය සේවාව ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

**ශෝකය සහ සමීප අය නැතිවූ අය සම්බන්ධ උපකාර**

**දුරකථන උපදේශනඃ**

ශෝකය සහ සමීප අය නැතිවූ අය සම්බන්ධ ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (The Australian Centre for Grief and Bereavement) මගින් වයෝවෘද්ධ රැකවරණ කායර් මණ්ඩලය, වයෝවෘද්ධ රැකවරණ සපයන්නන්, ආගමික සහ ප්‍රජා කණ්ඩායම් හට කෝවිඩ්-19 හේතුවෙන් ශෝකයට පත්වූ සහ සමීප අය නැතිවූ ප්‍රජාවන් හට උපකාර ලබාදේ. ඔබගේ ප්‍රජාව හට උපකාර ලබාදෙන ආකාරය සම්බන්ධ උපදෙස් සඳහා දුරකථන අංක 1800 222 200 අමතන්න.

ඔබ දුරකථනයෙන් ඇමතූ විට, ඔබට හෝ ඔබගේ සමීප අය හට ලබාදිය යුතු උපකාර සම්බන්ධයෙන් කථා කරන්න. මේවාට වෘත්තීකයෙකු සමඟ ටෙලිහෙල්ත් මගින් (දුරකථනය හෝ වීඩියෝ කන්ෆරන්සිංග් මගින්) හෝ මුහුණට මුහුණලා කෙරෙන කණ්ඩායම් උපදේශන, හෝ එක් එක් අය සමඟ උපදේශන ඇතුලත් විය හැකිය.

ශෝකය සහ නැතිවූ අය සම්බන්ධ ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය සතුව අරාබි, චෙක්, ෆාසි, ප්‍රංශ, ඉතාලි, ජපාන, මොල්ටා, සිංහල, දෙමළ, ස්පාඤ්ඤ, සහ යිඩිෂ් සේවාදායකයන් සමඟ වැඩ කල හැකි ද්වි භාෂා කායර් මණ්ඩල සිටී. ඔබ දුරකථනයෙන් කථා කල විට, ඔබගේ භාෂාව ඉල්ලා සිටින්න. වෙනත් භාෂා සඳහා, ප්‍රථමයෙන් දුරකථන අංක 131 450 ඔස්සේ භාෂා පරිවතර්න සහ තෝල්ක සේවාව අමතා, ශෝකය සහ නැතිවූ අය සම්බන්ධ ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය (The Australian Centre for Grief and Bereavement) ඉල්ලා සිටින්න.

ශෝකය සහ නැතිවූ අය සම්බන්ධ ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය මගින් ඕස්ලන් සහ බිහිරි සහ ශ්‍රව්‍ය අබාධ ඇති අය සඳහාද උපකාර ලබාදේ.

**ඩිමෙන්ෂියා උපකාරඃ**

ඕස්ට්‍රේලියානු ඩිමෙන්ෂියා උපකාර (Dementia Support Australia) මගින් ඕස්ට්‍රේලියාව පුරා දිනකට පැය 24, වසරකට දින 365 උපකාර ලබාදේ. ඔවුන් විසින් ඩිමෙන්ෂියා ඇති අයෙකු හට රැකවරණය ලබා දෙන අය හට උපදෙස් සහ නිදෙර්ශ ලබාදේ. දුරකථන අංක 1800 699 799 ඔස්සේ ඔවුන් අමතන්න. ඔබට හෝ ඔබගේ සමීප අයෙකු හට භාෂා පරිවතර්කයෙකු අවශ්‍ය නම්, කරුණාකර දුරකථන අංක 131 450 ඔස්සේ භාෂා පරිවතර්න සහ තෝල්ක සේවාව අමතා ඩිමෙන්ෂියා සපෝට් ඕස්ට්‍රේලියා (Dementia Support Australia) ඉල්ලා සිටින්න.

**උපදේශනඃ**

වයසින් වැඩි අය සඳහාවූ ජාලය (The Older Persons Advocacy Network) මගින් ඕස්ට්‍රේලියාව පුරා වයෝවෘද්ධ රැකවරණ උපදේශන සේවා ලබාදේ. ඔබට ලැබෙන වයෝවෘද්ධ රැකවරණ සේවා සම්බන්ධයෙන් ඔබට ගැටළු ඇතිනම්, ඔවුන් විසින් උපකාර ලබාදිය හැකිය. වයසින් වැඩි අය සඳහා වූ ජාලය මගින් වයසින් වැඩි අය සහ ඔවුන්ගේ පවුල් සහ නියෝජිතයන් හට නොමිළේ, රහසිගත, ස්වාධීන උපදේශන, තොරතුරු සහ අධ්‍යාපනය ලබාදේ. දුරකථන අංක 1800 700 600 ඔස්සේ ඔවුන් අමතන්න. ඔබට හෝ ඔබගේ සමීප අයෙකු හට භාෂා පරිවතර්කයෙකු අවශ්‍ය නම්, කරුණාකර දුරකථන අංක 131 450 ඔස්සේ භාෂා පරිවතර්න සහ තෝල්ක සේවාව අමතා වයසින් වැඩි අය සඳහාවූ ජාලය (The Older Persons Advocacy Network) ඉල්ලා සිටින්න.

**කෝවිඩ්-19 සම්බන්ධ වැඩිදුර විස්තර**

නිල මූලාශ්‍ර ඔස්සේ තොරතුරු ලබා ගැනීම වැදගත්වේ. health.gov.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම්, දුරකථන අංක 1800 020 080 ඔස්සේ ජාතික කොරෝනා වයිරස් උපකාරක සේවාව (National Coronavirus Helpline) අමතන්න. භාෂා පරිවතර්න සහ තෝල්ක සේවා සඳහා දුරකථන අංක 131 450 අමතා ජාතික කොරෝනා වයිරස් උපකාරක මාගර්ය (National Coronavirus Helpline) ඉල්ලා සිටින්න.